*සැ. යු.* - 2014.10.17 දින පළ වූ අංක 1,885 දරන ගැසට් පත්‍රයේ I: III සහ III යන කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,886 - 2014 ඔක්තෝබර් මස 24 වැනි සිකුරාදා - 2014.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1878 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1882 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1887 |

*සැ. යු.*- විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත, 2014 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1877 - B 80885- 2,875 (2014/10)
2 B 4 –

# බඩු බාහිරාදිය විකිණීම්

**තෙල්දෙණිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

බඩු බාහිරාදිය වෙන්දේසියේ විකිණීම

තෙල්දෙණිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු අංක සොයාගත නොහැකි නඩු භාණ්ඩ 2014.11.22 වැනි දින පෙ. ව. 10.00 ට තෙල්දෙණිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසි ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.15 සිට පෙ. ව. 9.45 තෙක් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂාකර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතු වේ.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එදිනම ප. ව. 3.00 ට පෙර මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන පුද්ගලයින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි.

රොහාන් ජයවර්ධන,
දිසා විනිසුරු,
තෙල්දෙණිය.

2014 සැප්තැම්බර් මස 05 වැනි දින,
තෙල්දෙණිය දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 01. | අංක රහිත | 142-0844 බජාජ් වර්ගයේ යතුරු පැදිය |
| 02. | 57215 | 110-3375 යමහා වර්ගයේ ඩී. ටී. යතුරු පැදිය |
| 03. | අංක රහිත | 151-7243 යමහා වර්ගයේ යතුරු පැදිය |
| 04. | 85870 | S. G. J. G. 1769 ත්‍රිවිල් රථය |
| 05. | අංක රහිත | අත්ට්‍රැක්ටර් 01යි |
| 06. | 13961 | අත්ට්‍රැක්ටර් 01යි |
| 07. | අංක රහිත | අත්ට්‍රැක්ටර් 01යි |
| 08. | අංක රහිත | අත්ට්‍රැක්ටර් 01යි |
| 09. | අංක රහිත | අත්ට්‍රැක්ටර් 01යි |
| 10. | PR 75/14 | බෝල මීටි 01යි |
| 11. | 6908 | වප් පිහියා 01යි |
| 12. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 13. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 14. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 15. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 16. | PR 75/10 | බෝල මීටි 01යි |
| 17. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 18. | අංක රහිත | මස් කපන පිහියා 01යි |
| 19. | 2498 | කටුගෙඩි 01යි<br>කපන කටු 03යි<br>බෝල මීටි 01යි<br>වාහන පනගන්වන ලීවර් 01යි |
| 20. | අංක රහිත | යකඩ ඉනි 01යි |
| 21. | PR 165/13 | කුලු ගෙඩි 01යි |
| 22. | PR 57/12 | උදළු 01යි<br>කුලු ගෙඩි 01යි<br>පොරෝ 01යි |
| 23. | අංක රහිත | කුලු ගෙඩි 01යි |
| 24. | 22412 | අලවංගු 01යි |
| 25. | අංක රහිත | හරස් කියත් 01යි |
| 26. | අංක රහිත | අලවංගු 01යි |
| 27. | අංක රහිත | අලවංගු 01යි |
| 28. | PR 96/14 | රවුම් කියත්තල 01යි |
| 29. | 17504 | රවුම් කියත්තල 01යි |
| 30. | අංක රහිත | රවුම් කියත්තල 01යි |
| 31. | අංක රහිත | රවුම් කියත්තල 01යි |
| 32. | 48533 | ජේන්සෝ මැෂින් 01යි |
| 33. | අංක රහිත | පාපැදි 01යි |
| 34. | අංක රහිත | පාපැදි 01යි |
| 35. | අංක රහිත | පාපැදි 01යි |
| 36. | අංක රහිත | පාපැදි 01යි |
| 37. | අංක රහිත | පාපැදි 01යි |
| 38. | අංක රහිත | පාපැදි 01යි |
| 39. | අංක රහිත | පාපැදි 01යි |
| 40. | අංක රහිත | අබලන් පාපැදි 01යි |
| 41. | අංක රහිත | අබලන් පාපැදි 01යි |
| 42. | 19952 | ඊමෙල් ජංගම දුරකථන 01යි |
| 43. | 18773 | නොකියා ජංගම දුරකථන 01යි |
| 44. | 20549 | නොකියා ජංගම දුරකථන 01යි |
| 45. | 16740 | සැම්සුන් ජංගම දුරකථන 01යි |
| 46. | 19910 | නොකියා ජංගම දුරකථන 01යි |
| 47. | 14067 | ඇල්කටෙල් ජංගම දුරකථන 01යි |
| 48. | 20739 | නොකියා ජංගම දුරකථන 01යි |
| 49. | 20789 | නොකියා ජංගම දුරකථන 01යි |
| 50. | 21070 | නොකියා ජංගම දුරකථන 01යි |
| 51. | 18675 | නොකියා ජංගම දුරකථන 01යි |
| 52. | 21850 | නොකියා ජංගම දුරකථන 01යි |
| 53. | අංක රහිත | නොකියා ජංගම දුරකථන 01යි |
| 54. | අංක රහිත | ඔරියන් ජංගම දුරකථන 01යි |
| 55. | 18488 | ස්ටාර් ජංගම දුරකථන 01යි |
| 56. | අංක රහිත | බර්ඩ් ජංගම දුරකථන 01යි |
| 57. | අංක රහිත | බිලු ජංගම දුරකථන 01යි |
| 58. | 81991 | නොකියා ජංගම දුරකථන 01යි |
| 59. | 19461 | ජී. මොබයිල් ජංගම දුරකථන 01යි |
| 60. | 21824 | නොකියා ජංගම දුරකථන 01යි |
| 61. | අංක රහිත | ඩිමන්ස් ජංගම දුරකථන 01යි |
| 62. | 21000 | මැක්ස් මොබටිල් ජංගම දුරකථන 01යි |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 63. | අංක රහිත | පෝඩ් ජංගම දුරකථන 01යි |
| 64. | 23526 | නොකියා ජංගම දුරකථන 01යි |
| 65. | අංක රහිත | ඩීගෝ ජංගම දුරකථන 01යි |
| 66. | 20693 | ඊමෙල් ජංගම දුරකථන 01යි |
| 67. | අංක රහිත | ඩූ ජංගම දුරකථන 01යි |
| 68. | අංක රහිත | ඩූ ජංගම දුරකථන 01යි |
| 69. | අංක රහිත | ඩූ ජංගම දුරකථන 01යි |
| 70. | 23419 | නොකියා ජංගම දුරකථන 01යි |
| 71. | අංක රහිත | යකඩ මුල්ලු 01යි |
| 72. | PR 68/10 | යකඩ අලවංගු 01යි |
| 73. | 13961 | කියත් තලය සමග යකඩ මේස 01යි |
| 74. | අංක රහිත | යකඩ මේස 01යි |
| 75. | අංක රහිත | යකඩ මේස 01යි |
| 76. | අංක රහිත | කියත් තලය සමග යකඩ මේස 01 |
| 77. | අංක රහිත | යකඩ මේස 01යි |

10-778

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - දෙයියන්දර

### අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දෙයියන්දර මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2014.11.15 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම ඉදිරිපත් කළ යුතු ය.

02. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ මහජනයාට පරීක්ෂා කළ හැක.

03. අධිකරණය විසින් නියම කරන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගත හැකි අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

උද්දාල සුවන්දුරුගොඩ,
මහෙස්ත්‍රාත්,
දෙයියන්දර.

2014 ඔක්තෝබර් මස 02 වැනි දින,
දෙයියන්දර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 01. | A. R. 23/12 | චේන්සෝ යන්ත්‍ර 01යි |
| 02. | 14289 | චේන්සෝ යන්ත්‍ර 01යි |
| 03. | 0442 | අංක 971 දරන තැඹිලිපාට චේන්සෝ යන්ත්‍ර 01යි |
| 04. | 10621 | චේන්සෝ යන්ත්‍ර 01යි |
| 05. | A. R. 176/12 | 96 ශ්‍රී 1063 දරන යතුරු පැදි 01යි (අමතර කොටස් සඳහා) |
| 06. | A. R. 40/12 | 140-3840 දරන C. 90 වර්ගයේ යතුරු පැදි 01යි |
| 07. | A. R. 554/08 | අංක එල් ඊ FMGCO 446854 දරන ලොන්සින් වර්ගයේ යතුරු පැදි 01යි. (අමතර කොටස් සඳහා) |
| 08. | 13152 | එන්ජින් අංක 060003 හා චැසි අංක V 06004 ෆාම් මාස්ටර් වර්ගයේ අත්ට්‍රැක්ටර් 01යි (අමතර කොටස් සඳහා) |
| 09. | 04718 | අංක 77-5446 දරන සීනෑන් වර්ගයේ අත්ට්‍රැක්ටර් 01යි. (අමතර කොටස් සඳහා) |
| 10. | A. R. 112/12 | චැසි අංක කේ. ඒ. 0130 හා එන්ජින් අංක ජී. ඩී. 61606 දරන අත්ට්‍රැක්ටර් 01යි (අමතර කොටස් සඳහා) |
| 11. | A. R. 02/11 | අංක (WPGC 2937) දරන අබලන් තත්වයේ ත්‍රීවිල් රථය (අමතර කොටස් සඳහා) |
| 12. | A. R. 114/13 | පාපැදි 01යි |
| 13. | A. R. 139/11 | පාපැදි 01යි |
| 14. | A. R. 115/13 | පාපැදි 01යි |
| 15. | A. R. 459/13 | පාපැදි 01යි |
| 16. | 05657 | දුනු තරාදි 01යි |
| 17. | 01813 | 5kg තැටි තරාදිය හා පඩි කට්ටලය |
| 18. | 01669 | තරාදි 01 යි |
| 19. | 84622 | උදලු 01යි |
| 20. | 80174 | උදලු 01යි |
| 21. | 85943 | උදලු 01යි |
| | | කුඩ 01යි |
| | | තාච්චි 01යි |
| 22. | 80511 | උදලු 01යි |
| 23. | 96524 | උදලු 01යි |
| | | කුඩ 01යි |
| 24. | 96862 | චේවැල් කුඩ 03යි |
| | | උදලු 01යි |
| 25. | 96286 | උදලු 01යි |
| 26. | 03831 | උදලු 01යි |
| | | ගැරුම් වට්ටි 01යි |
| | | චේවැල් කුඩ 01යි |
| | | හිස් බාස්කට් 02යි |
| 27. | 02172 | චේවැල් කුඩ 01යි |
| 28. | 01673 | උදලු 01යි |
| 29. | 01618 | උදලු 01යි |
| 30. | 1656 | උදලු 01යි |
| 31. | 73983 | උදලු 01යි |
| 32. | 05620 | ගැරුම් වට්ටි 02යි |
| | | උදලු 01යි |
| | | හිස් පිලර් බාස්කට් 02යි |
| | | කුඩ 01යි |
| 33. | 00537 | උදලු 01යි |
| | | කුඩ 01යි |
| 34. | 0232 | පොඩි උදලු 01යි |
| 35. | 07932 | උදලු 01යි |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 36. | 07929 | උදලු 01යි |
| 37. | 07929 | උදලු 01යි |
| 38. | B. R. 307/12 | උදලු 01යි |
| 39. | A. R. 47/11 | රබර් රොටී 21යි |
| 40. | A. R. 10/10 | වක් පිහිය 01යි |
| 41. | A. R. 376/12 | කැති 01යි |
| 42. | 80512 | පිහිය 01යි |
| 43. | B. R. 51/12 | යකඩ කුරු 01යි |
| 44. | 05494 | වක් පිහිය 01යි |
| 45. | B. R. 416/13 | වක් පිහිය 01යි |
| 46. | B. R 158/13 | පොරව 01යි |
| 47. | A. R 378/12 | ඇලිස් කටු 01යි |
| 48. | A. R 131/11 | කැති 01යි |
| 49. | A. R 09/10 | පිහිය 01යි |
| 50. | 4940 | කැති 01යි |
| 51. | 06601 | වක් පිහිය 01යි |
| 52. | 4847 | මාළු පිහිය 01යි |
| 53. | 03719 | පොරව 01යි |
| 54. | 83827 | පිහිය 01යි |
| 55. | A. R 420/12 | කැති 01යි |
| 56. | 11179 | පිහිය 01යි |
| | | මන්නා පිහිය 01යි |
| | | පොරව 01යි |
| 57. | 04894 | පොරව 01යි |
| 58. | 02685 | පොරව 01යි |
| 59. | 04563 | හරස් කියත් 01යි |
| 60. | 13659 | බණ්ඩි කියත් 01යි |
| | | අත් පොරව 01යි |
| | | සුදු පාට කඹ 01යි |
| 61. | 01814 | ලීටර් 01 ඔයිල් කෑන් 01යි |
| 62. | 5806 | ජංගම දුරකථන 01යි |
| 63. | A. R 133/11 | ජංගම දුරකථන 01යි |
| 64. | 05667 | ජංගම දුරකථන 01යි |
| 65. | A. R 553/08 | මෝටරෝලා ජංගම දුරකථනය |
| 66. | 03671 | පරිගණක ජැක් 01යි |
| | | වයර් 01යි |
| 67. | 04799 | හයි ස්පීඩ් කියත් තල 01 |
| 68. | 03981 | හයි ස්පීඩ් කියත් තල 01 |
| 69. | 04800 | හයි ස්පීඩ් කියත් තල 01 |
| 70. | 08626 | හයි ස්පීඩ් කියත් තල 01 |
| 71. | 04574 | ගවුම් රෙදි Im |
| 72. | 04798 | චීත්ත රෙදි 1/2 m |
| 73. | 05917 | ෂර්ට් රෙදි 1m |
| 74. | 02574 | චීත්ත රෙදි 1/2 m |
| 75. | 05914 | රෙදි 1 m |
| 76. | 05472 | හැට්ට රෙදි කැබලි 01යි |
| 77. | 04573 | විදුලි පන්දම් 01යි |
| 78. | 02563 | විදුලි පන්දම් 01යි |
| 79. | 02570 | විදුලි පන්දම් 01යි |
| 80. | 02023 | විදුලි පන්දම් 01යි |
| 81. | 0560 | විදුලි පන්දම් 01යි |
| 82. | 02569 | විදුලි පන්දම් 01යි |
| 83. | 06226 | බේබි හෙල්මට් 01යි |
| 84. | 0649 | මල්ටි කෝඩ් 01යි |
| 85. | 0561 | වයර් කෝඩ් 01යි |
| 86. | 01126 | මල්ටි කෝඩ් 01යි |
| 87. | 01935 | ටයිල් ග්‍රවුට් පැකට් 01යි |
| 88. | 03644 | අත්මේස් ජෝඩු 01යි |
| 89. | 03355 | ෆෝන් චාජර් 01යි |
| 90. | 02557 | ෆෝන් චාජර් 01යි |
| 91. | 07110 | ෆෝන් චාජර් 01යි |
| 92. | 02615 | ෆෝන් චාජර් 01යි |
| 93. | 02571 | ෆෝන් චාජර් 01යි |
| 94. | 02613 | ෆෝන් චාජර් 01යි |
| 95. | 2562 | ෆෝන් චාජර් 01යි |
| 96. | 05901 | ෆෝන් චාජර් 01යි |
| 97. | 06880 | ෆෝන් චාජර් 01යි |
| 98. | 01934 | චීත්ත රෙදි 1/2 m 01යි |
| 99. | 02564 | චීත්ත රෙදි 1/2 m 01යි |
| 100. | 02572 | පොප්ලින් 1m 01යි |
| 101. | 03643 | ප්ලාස්ටික් සල්ලි කැට 01යි |
| 102. | 06781 | ලන්ච් ෂීට් 1000යි |
| 103. | 03373 | කඳත් ලොක් 01යි |
| 104. | 02770 | බයින්ඩින් 100 g - 01යි |
| 105. | 02765 | බයින්ඩින් 100 g - 01යි |
| 106. | 04928 | ළමා පාවහන් යුගල 01යි |
| 107. | 02622 | බයිසිකල් බෝල පැකට් 01යි |
| 108. | 05921 | ජියර් කේබල් 01යි |
| 109. | 05910 | කොන්ට්‍රෝල් කේබල් 01යි |
| 110. | 02616 | ජියර් ඔයිල් ලීටර් 01යි |
| 111. | 04576 | ඔරලෝසු බෙල්ට් 01යි |
| 112. | 01120 | මවුස් 01යි |
| 113. | 04929 | මවුස් 01යි |
| 114. | 02559 | ඉබි (පැඩ්ලොක්) 01යි |
| 115. | 04931 | කාන්තා ඔරලෝසු 01යි |
| 116. | 07111 | ස්ප්‍රේ කෑන් 01යි |
| 117. | 5471 | පුටු කවර 12ක් අඩංගු ඇසුරුම |
| 118. | | කාර්යාල පරිහරණයෙන් ඉවත් කරන ලද ස්ටෙප්ලර් 08යි |
| 119. | | හිස් බෝතල් තොගයක් |
| 120. | | හිස් ප්ලාස්ටික් කෑන් තොගයක් |
| 121. | | හිස් මැටි මුට්ටි තොගයක් |
| 122. | | ඇලුමිනියම් තල 01යි |
| 123. | | ඇලුමිනියම් හට්ටි කිහිපයක් |
| 124. | | දිරාගොස් ඇති යකඩ බැරල් 10යි |
| 125. | | ඉවත් කල වැසිකිළි කට්ටලය (කොමඩ්) 01යි |
| 126. | | නඩු අංක රහිත යකඩ විල් බැරෝ 01යි |
| 127. | | කාර්යාල පරිහරණයෙන් ඉවත් කරන ලද අබලන් තත්වයේ ගැල්වනයිස් කුරු සහිත කැඩී ඇති පුටු කිහිපයක් |
| 128. | | මහෙස්ත්‍රාත්තුමාගේ නිලරථයෙන් ඉවත් කරන ලද අමතර කොටස් |

(1) ABSORBER SHOCK
(562104 M 426) - 02

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|

(2) CLURCH DISC
(30100 - 4 M 405) - 01

(3) CLUTCH COVER
(3021055 C 05) - 01

(4) BUMPER ASSY BOU
(54050 - 2 J200) - 02

(5) SOCKET ASSY
(48521 - 4 M 401)

(6) BUMPER
(54052 - OMO11) - 02

(7) RADIATOR CAP - 01
(0.9)

(8) WHIPPER PLET - 02

(9) STRUT KIT FRONT - 02
(54303 - 6 N 025)

(10) SHOKER ARMS - 02

(11) PISTON KIT - 01
(30611 - 5 N325)

(12) PAD KIT DISC - 04 PIECES
(41060 - 6 NO91) (B0X - 01)

(13) INSULATOR - STRUT
(54320 - 4 M 401)

(14) BELTS - 02

(15) INSULATOR ASSY
(11270 - 95FOA) - 01

(16) BOLLER JOINT - 02

(17) PLUG (NGK) - 04

(18) RUBBER BUSH - 02

(19) AKEBONO (5/8 - J) 02

(20) MC 2 - 12
2224615 - A
JUDECO - 6831
WHIPPE - MOTOR } 01

(21) NSK RESER - 01

(22) AKEBONO SELKER -03

(23) PACKING - 01

(24) SPRING - 02

10-793

---

## නිවැරදි කිරීමයි

**වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

2014.10.17 වැනි දින පළකරන ලද අංක 1885 දරන ගැසට් පත්‍රයේ බඩු බාහිරාදිය විකිණීම් යටතේ ඉහත අධිකරණය මගින් පවත්වනු ලබන වෙන්දේසි නිවේදනයේ අවසානයේ අනු අංකය 97 ලෙස වැරදියට මුද්‍රණය වී ඇත. එය 87 ලෙස නිවැරදි විය යුතු ය.

දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
වැල්ලවාය.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැල්ලවාය.

10-1171

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

තිත්තපත්තර, යටිටෝවිට, "රිවර් බ්‍රීස්" අංක 60/6 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 733580593 වී දරන ඉලන්දාරි දේවගේ තුෂාර හේමන්ත වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. ජී. බී. අබේරත්න මහතා විසින් 2013.11.15 වැනි දින ලියා සහතික කරන ලද අංක 493, දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 05, ලයනල් එදිරිසිංහ මාවත, අංක 49 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 603390997 වී දරන රොනල්ඩ් මයිකල් ස්ටැන්ලි වෙත පවරන ලද ඇටෝර්නි බලතල 2014.10.08 වැනි දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

10-786

---

## දැන්වීමයි

දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු පාර, අංක 23/1 හි පදිංචි වීරසේකර මුදියාන්සේලාගේ වජිර චන්දන නොහොත් වජිර චන්දන වීරසේකර (ජා. හැ. අ. 680120633 වී) වන මා විසින් දැනට දෙහිවල, පාමංකඩ, දුටුගැමුණු පාර, අංක 23/1 හි පදිංචි පැල්මඩුල්ල, වීරසේකර වලව්වේ වීරසේකර රාජකරුණා වාසල මුදියාන්සේ රාළහාමිලාගේ හැරී ඩොනල්ඩ් වීරසේකර නොහොත් හැරී වීරසේකර (ජා. හැ. අ. 360050394 වී) යන අයට දී තිබූ ජී. ඒ. සී. ප්‍රියන්ති ගනේපොල, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද 1989 ඔක්තෝබර් මස 02 වැනි දින සහ අංක 170 දරන ඇටර්නි බලපත්‍රය 2014ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පටන් බලරහිත, ප්‍රත්‍යාදිෂ්ඨ සහ නිෂ්ප්‍රභා කරන බව මෙයින් දැනුම් දෙමි.

10-810

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර එම්. සී. එස්. කම්පියුටර් සිස්ටම්ස් (පී වී ටී) එල්ටීඩී 2009 දෙසැම්බර් මස 16 වැනි දින සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

ලියාපදිංචි අංකය : පී වී 70388
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 32, තුඩැල්ල හන්දිය, ජාඇල.

අධ්‍යක්ෂ.

10-809

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳ දැන්වීම

ජනිත රංගන පොතුපිටියගේ අංක 42 බලගල පාර, හැඳල වත්තල වන මා විසින් ඇතිගේ ඉවෝන් ෂැලෝම් සිල්වා යන අයව මා වෙනුවෙන් සහ මා නමින් ක්‍රියා කිරීම සඳහා පත් කරමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. එල්. එස්. සෙනෙවිරත්න මහතා මගින් ලියා සහතික කළ අංක 49 සහ 2008.11.22 දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් අවලංගු කොට අහෝසි කොට බල රහිත කළ බව සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජනිත රංගන පොතුපිටියගේ.

අංක 42, බලගල පාර,
හැඳල, වත්තල.

10-817

---

## හාර්ඩි ජේම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳ මහජනතාවට කෙරෙන දැනුම් දීමයි

2014 සැප්තැම්බර් මස 19 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 100978 යටතේ හාර්ඩි ජේම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, නැගෙනහිර කුළුණ, 16 වන තලය හි අංක 16-03 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),

එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය)
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

10-822

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔලෙක්මෝ මිනරල් ඇන්ඩ් ප්‍රොසෙසිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 101145
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 167/1, වතුපිටිවල, නිට්ටඹුව.

10-823

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඒ. එම්. ඔටෝ මාර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98669
සංස්ථාගත කළ දිනය : 2013.05.21
ලියාපදිංචි කාර්යාලය : අංක 65/54 ඒ, කරුණාරත්න පාර, කහවිට මාවත, අත්තිඩිය, දෙහිවල

කලෙහි මේස්ත්‍රි ආචාරිගේ ජයන්තාමාලි,
සමාගම් ලේකම්.

10-824

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

එක්සත් රාජ්‍යය (යූ. කේ.), ටීඑන් 37-6 එන් එච්, ශාන්ත ලෙනාර්ඩ්ස්-ඔන්-සී, නෝමන් පාර, අංක 20 දරන ලිපිනයේ පදිංචි සිවපාලන් අම්ජත්කුමාර් වන මා විසින් මඩකලපුව, බන්ඩ්ංස් පටුමග, අංක 28 හි පදිංචි මාණික්කම් වික්නේස්වරන් යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරන ලද මඩකලපුවේ ප්‍රසිද්ධ නොතාරිස් අමරසිංගම් මහාලිංගසිවම් විසින් ලියා සහතික කරන ලද 2009 සැප්තැම්බර් මස 19 වැනි දිනැති අංක 1073 දරන ඇටෝර්නි බලපත්‍රය 2014 සැප්තැම්බර් මස 29 වැනි දින පටන් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන අතර වර්ෂ 2014 සැප්තැම්බර් මස 29 වැනි දින එකී මාණික්කම් වික්නේස්වරන් යන අය මා වෙනුවෙන් ඇතුළත් වන කිසිඳු ගිවිසුමක් වෙනුවෙන් මා කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

අම්ජත්කුමාර් සිවපාලන්.

අංක 20,
නෝමන් පාර, ශාන්ත ලෙනාර්ඩ්ස්- ඔන් - සී,
ටීඑන් 37 6 එන්එච්, එක්සත් රාජ්‍යය (යූ. කේ.).

10-837

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

සියලු දෙනාම දැනගත යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ පිළියන්දල, මිරිස්වත්ත, වෙල්ලන්ගහවත්ත, අංක 34 දරන ස්ථානයෙහි පදිංචි ජයසේකර මුදියන්සේලාගේ ඉන්ද්‍රජීව චන්ද්‍රසිරි වන මම ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. එස්. පෙරේරා මහතා විසින් වර්ෂ 2014.01.14 වැනි දින ලියා සහතික කළ අංක 278 දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2014.10.01 වැනි දින අවලංගු කළ බව සියලු දෙනා වෙත දන්වා සිටිනු ලැබේ.

ජයසේකර මුදියන්සේලාගේ ඉන්ද්‍රජීව චන්ද්‍රසිරි.

අංක 34, වෙල්ලන්ගහවත්ත,
මිරිස්වත්ත,
පිළියන්දල.

10-842

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි.

සමාගමේ නාමය : ඔටෝ ඩයිනමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 31/එස්/27, 2 වැනි පටුමග, සුප්‍රිම් සිටි,
කහන්තොට පාර, මාලබේ
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 22 වැනි දින
ලියාපදිංචි අංකය : පී වී 101027

10-843

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : නවාරා ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100615
සංස්ථාගත කළ දිනය : 2014.09.02
ලියාපදිංචි ලිපිනය : අංක 65/3, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

ලේකම්වරු.

10-864/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : සිරි රම්‍යා හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 63878
සංස්ථාගත කළ දිනය : 2008.04.22
ලිපිනය : අංක 119, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර.

ලේකම්වරු.

10-864/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : ත්‍රී අයි ට්‍රේනිං සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100563
සංස්ථාගත කළ දිනය : 2014.09.09
ලියාපදිංචි ලිපිනය : අංක 719, ඩී. පී. විජේසිංහ මාවත, පැලවත්ත,
බත්තරමුල්ල.

ලේකම්වරු.

10-864/3

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : හෙම්ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 89047
සංස්ථාගත කළ දිනය : 2012.10.24
ලියාපදිංචි ලිපිනය : අංක 14/3 ඒ, ලේඩි එවුලින්ද සොයිසා පාර,
මොරටුව.

ලේකම්වරු.

10-864/4

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මෙහි පහත අත්සන් කරන සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, කල්තොට, කොලොම්මඩ පදිංචි යටිඅරාවේ සයනේරිස් නොහොත් සරනේලිස් (ජා. හැ. අංක 370962812 වී) වන මා අසනීප තත්වයේ පසු වූ කාලවකවානුවේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. චන්ද්‍රසේකර මහතා විසින් ලියා සහතික කරන ලද අංක 13439 හා 2012.10.25 දිනත් දරන ඇටෝර්නි බලපත්‍රයෙන් එකී ඇටෝර්නි බලපත්‍රයේ ඇටෝර්නි බලකරු වූ සීතගල සුහසිංහගේ චන්ද්‍රදාස යන අය වෙත බලය පවරන ලදී. එසේ පවරන ලද ඇටෝර්නි බලය අද දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට, අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. එසේ ම ඔහු විසින් මා වෙනුවෙන් එළඹෙනු ලබන කවර හෝ ගනුදෙනුවකට අද දින සිට මා වග නොකියන බවටත් ප්‍රකාශ කර සිටිමි.

යටිඅරාවේ සරනේරිස් නොහොත් සරනේලිස්,
(ඇටෝර්නි අධිපති)

2014 ක් වූ අගෝස්තු මස 23 වැනි දින.

10-868

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම පිළිබඳ නිවේදනයයි

රජිතා ෆ්‍රැන්සස් වික්‍රමරත්න, අංක 30/10, වියා දි ප්‍රතිග්ලිඕලෝ 21, 00062 විග්නා දි වැලි, බ්‍රසියානෝ ආර්එම්, ඉතාලිය යන ලිපිනයෙහි පදිංචිව සිටින මා මහජනතාව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මෙයින් දන්වා සිටිනුයේ අංක 29/16, ශ්‍රී ආනන්දබෝධි විහාර මාවත, අඟුලාන, මොරටුව දරන ස්ථානයේ පදිංචි වට්ටොරුතන්ත්‍රිගේ උපුල් අරුණජිත් ප්‍රනාන්දු යන මාගේ ඇටර්නි බලකරු ලෙස ඉතාලියෙහි රෝමයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ මිනිස්ටර් කොන්සල්, ඩබ්ලිව්. එම්. ධර්මපාල මහතා සහතික කළ 2011.07.17 දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය අද දින සිට අහෝසි කර අවලංගු කර බලරහිත කළ බවයි. මා වෙනුවෙන් ඔහු කරන ඕනෑම ක්‍රියාවක් වෙනුවෙන් මින් මතු මා වග නොකියන බව ද දන්වා සිටිමි.

රජිතා ෆ්‍රැන්සස් වික්‍රමරත්න.

10-891

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ඉන්ෆිනිටි වැකේෂන්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 100573
ලියාපදිංචි ලිපිනය : අංක 03, පරණ ක්වාරි පාර, ගල්කිස්ස.

සමාගමේ නම : යූ. ජී. එල්. හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 100450
ලියාපදිංචි ලිපිනය : අංක 35/සී, පැනසොනික් ගොඩනැගිල්ල, 02 තට්ටුව, නාවල පාර, නුගේගොඩ.

සමාගමේ නම : කමලාග්‍රොව් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 101234
ලියාපදිංචි ලිපිනය : අංක 46/12, වැලිකඩවත්ත පාර, නාවල පාර, රාජගිරිය, කොළඹ

සමාගමේ නම : ඩී කේ එන් කැෆේ (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 101006
ලියාපදිංචි ලිපිනය : අංක 438, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03

සමාගමේ නම : ද බ්ලූ බීච් එක්සොටිකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 101049
ලියාපදිංචි ලිපිනය : අංක 438, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපර්රේට් සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

10-895

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 44, වඳුරාමුල්ල වත්ත, කිරිබෙරියාව, පානදුර ලිපිනයේ පදිංචි බාලචන්ද්‍ර ආරච්චිගේ දොන් ප්‍රසන්න නාමල් වන මා විසින් ලංකා ඔරික්ස් ලීසිං සමාගම හෝ එහි උප සභාපති කළමනාකාර අධ්‍යක්ෂක හෝ අධ්‍යක්ෂක මඩුල්ල මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කරමින් පිළියෙල කරන ලෙස ප්‍රසිද්ධ නොතාරිස් මුල්ලේගම මුදියන්සේලාගේ කාන්චනා කුමාරි විසින් ලියා සහතික කරන ලද අංක 1395 සහ 2013 නොවැම්බර් මස 07 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මෙලෙසින් අවලංගු කරන අතර මින් මතු එකී ඇටර්නි බලකරුවන් විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද මෙයින් ශ්‍රී ලංකා ජනරජයට සහ පොදු මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

10-899

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, ඌස්ටනඩේ 8400, එලිසබෙත්ලාන් 393 හි පදිංචි ඩිවෝස් රිනී වන මම මහනුවර, හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014.08.25 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014.08.25 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ඩිවෝස් රිනී.

2014 ක් වූ අගෝස්තු මස 25 වැනි දින.

10-902

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, 8820 ඌස්ට්නිව්කෙරේකෙ, ස්ලේහේග්හෙස්ට්‍රාට් 3 හි පදිංචි වැන් වැලේහෙම් හෙන්ඩ්‍රික් වන මම ශ්‍රී ලංකාවේ මහනුවර, හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් ලබා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014 ජුනි මස 23 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014 ජුනි මස 23 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

වැන් වැලේහෙම් හෙන්ඩ්‍රික්.

2014 ක් වූ සැප්තැම්බර් මස 11 වැනි දින.

10-903

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, වූස්ට්වෙසල් 2990, බ්‍රෙඩාබාන් 687 හි පදිංචි ගුසන්ස් ඒඩ්‍රියන් අන්ටූන් වන මම මහනුවර, හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014 ජුනි මස 23 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014.07.31 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ගුසන්ස් ඒඩ්‍රියන් අන්ටූන්.

2014 ක් වූ ජූලි මස 31 වැනි දින.

10-904

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, ආස්කොට් 3200, ජෝසෆ් තිලේමන්ස්ට්‍රාට් අංක 57/4 හි පදිංචි නම්ෆොන් ලිසන්ස් වන මම මහනුවර, හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014 අගෝස්තු මස 26 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014 අගෝස්තු මස 25 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

නම්ෆොන් ලිසන්ස්.

2014 ක් වූ අගෝස්තු මස 25 වැනි දින.

10-905

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, ආස්කොට් 3200, ජෝසෆ් තිලේමන්ස්ට්‍රාට් අංක 57/4 හි පදිංචි ජෙට්සාඩා ලිසන්ස් වන මම මහනුවර හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014.08.26 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014.08.25 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ජෙට්සාඩා ලිසන්ස්.

2014 ක් වූ අගෝස්තු මස 25 වැනි දින.

10-906

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, ඇන්ට්වර්ප් 2140 වින්කොටේස්ට්‍රාට් අංක 57/2 හි පදිංචි ගුස්සන්ස් ජොසී මාර්තා ඔගස්ටා වන මම මහනුර හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014 ජුනි මස 23 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014 ජූලි මස 31 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

ගුස්සන්ස් ජොසී මාර්තා ඔගස්ටා.

2014 ක් වූ ජූලි මස 31 වැනි දින.

10-907

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බෙල්ජියමේ, ආස්කොට් 3200, එලිසබෙත්ලාන් 85/1 හි පදිංචි විල්මා ලිසන්ස් වන මම මහනුවර, හන්තාන නිවාස සංකීර්ණයේ අංක 17/B/2/A1 හි පදිංචි අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අයට 2012.04.14 වැනි දින බෙල්ජියමේ දී සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා දී තිබුණු සියලු බලයත් එම ඇටෝර්නි බලපත්‍රයත් 2014 අගෝස්තු මස 26 වැනි දින සිට මා අවලංගු කළ බව ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

2014 අගෝස්තු මස 25 වැනි දින සිට එය බල රහිත සහ නීතියෙන් වලංගු නොවන හෙයින් මින්පසු ඉහත කී ඇටෝර්නි බලපත්‍රය මගින් අහංගම වලව්වගේ අජිත් රොහාන් ධර්මප්‍රේම යන අය කරනු ලබන කිසිම ක්‍රියාවකට හෝ ගණුදෙනුවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කරමි.

විල්මා ලිසන්ස්.

2014 අගෝස්තු මස 25 වැනි දින.

10-908

### දැන්වීම

බීට්මන් ඩබ්ජ් හි 6150 ටින්ටල් වේ අංක 09 දරන ස්ථානයේ දැනට වාසය කරන බද්දේගම, නිල්හේනහි "නිල්ගිරි" හි පදිංචි බන්දුල ඉන්ද්‍රජිත් ඉලේපෙරුම ගුණවර්ධන විසින් ශ්‍රී ලංකාවේ, බද්දේගම හල්පොතහි පදිංචි සිරිසේන අකුරුගොඩ වෙත ප්‍රදානය කරන ලද බලපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ශාන්ත ශ්‍රී කුමාර කවිරත්න විසින් සහතික කරනලද අංක 305 හා 1999 ජනවාරි මස 3 දිනැති පොදු ඇටෝර්නි බලපත්‍රය අද දින සිට මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ට කරන ලද බවත් , මෙතැන් සිට එකී සිරිසේන අකුරුගොඩ විසින් මා වෙනුවෙන් සිදුකරනු ලබන කිසියම් ගනුදෙනුවකට බන්දුල ඉන්ද්‍රජිත් ඉලේපෙරුම ගුණවර්ධන වන මා වගකීම් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජය වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

10-921

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) දරන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

ආයතනයේ කලින් නම : සරේ මියුසික් (ප්‍රයිවට්) ලිමිටඩ්
ආයතනයේ අංකය : පී වී 96726
ලියාපදිංචි ලිපිනය : අංක 1, කාසල් ඇවනිව්, කොළඹ 08
ආයතනයේ අලුත් නම : ඉන්ෆොලොජික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

10-881

### ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ගල්කඩවල ෆොරස්ට ලොජ් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 100736
සංස්ථාගත කළ දිනය : 2014 සැප්තැම්බර් මස 05 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ගල්කඩවල, පලුගස්වැව, හබරණ.

දෝන මෞලී ද සේරම්,
අධ්‍යක්ෂ.

10-784

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

ආයතනයේ නම : එනමෝ කෝපරේෂන් (පීවීටී) ලිමිටඩ්
ආයතනයේ අංකය : පීවී 100507
ලියාපදිංචි ලිපිනය : අංක 35 1/1, හින්නිඅප්පුහාමි මාවත, කොළඹ 13.

ආයතනයේ නම : හෝලි ෆැමිලි ස්පීච් ඇන්ඩ් ලැන්වේජ් ට්‍රේනිං සෙන්ටර් (පීවීටී) ලිමිටඩ්
ආයතනයේ අංකය : පී වී 100708
ලියාපදිංචි ලිපිනය : අංක 3, නිවාස මාවත, කඳාන.

ආයතනයේ නම : ස්කයි ගාඩ්න් (පීවීටී) ලිමිටඩ්
ආයතනයේ අංකය : පී වී 100838
ලියාපදිංචි ලිපිනය : අංක 28/5, රබර්වත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

10-882

### දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| එච් ඇන්ඩ් සී ග්‍රැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී. වී. 101142 | 2014.09.25 | අංක 54/20, කොටිකාවත්ත පාර, ගොතටුව, නව නගරය |
| හයිඩ්‍රෝඩයනමික්ස් ඇන්ඩ් ජියෝෆිසිකල් සර්වේ (පීවීටී) ලිමිටඩ්. | පී වී 73955 | 2014.08.26 | අංක 461/28, ෂාවෘඩ් ග්ලේඩ්, අරංගල. |

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (පීවීටී) එල්. ටී. ඩී,
සමාගම් ලේකම්වරු.

10-893

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩී එෆ් සී සී බැංකුව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 1960 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

උතුරු පළාතේ, වව්නියාව දිස්ත්‍රික්කයේ, දකුණු වව්නියාවේ, වව්නියාව කිලක්කුමුලෙ දකුණ නගර සභා සීමාවට අයත්, වෛරවපුලියන්කුලම් හි පිහිටි, බලයලත් මිනින්දෝරු එස්. රවීන්ද්‍රනායගම් විසින් සාදන ලද 2011 මැයි මස 05 වැනි දිනැති අංක 29482 දරන පිඹුරේ ලොට් අංක 02 ලෙස දැක්වෙන බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

*ඉඩමේ ප්‍රමාණය :* හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි දෙකයි අටයි (0.0828 හෙක්.) හෙවත් පර්චස් තිස්දෙකයි දශම හතයි තුනයි
අක්. 0 රූඩ් 0 පර්. 32.73)

ඉහත කී දේපළ බලයලත් මිනින්දෝරු සුභාෂ් චන්ද්‍ර බෝස් විසින් සාදන ලද 2000 මාර්තු මස 18 වැනි දිනැති අංක 20220 දරන පිඹුරේ ලොට් අංක 05 සහ තවත් නොබෙදූ ඉඩමක භාගයක් වන, පාලයඩිවලවු ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු කේ. කනපතිපිල්ලයි විසින් සාදන ලද 1994 ඔක්තෝබර් මස 10 වැනි දිනැති අංක 9426 දරන පිඹුරේ ලොට් අංක 05 ලෙස දැක්වෙන ඉඩම් කොටස්වල එකතුවකි.

ඉඩමේ ප්‍රමාණය : පිළිවෙලින් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි එකයි හතයි එකයි (0.01171 හෙක්.) සහ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි තුනයි දෙකයි හයයි (0.01326 හෙක්.)

වව්නියාව ප්‍රසිද්ධ නොතාරිස් පී ඇනොටන් පුනිතනායගම් විසින් සහතික කරන ලද 2012 පෙබරවාරි මස 06 වැනි දිනැති අංක 1960 දරන උකස්කරය ප්‍රකාර, වව්නියාව RTY ස්ටේෂන් වීව් අංක 40/1 යන ස්ථානයේ පදිංචි කුලේන්ද්‍රන් සජේන්ද්‍රා සහ තයාලිනි සජේන්ද්‍රා විසින් ඩී එෆ් සී සී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014 නොවැම්බර් මස 12 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2. (සියයට දෙකහමාරක්),
4. රු. 102,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011-2442442.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

10-878

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2014ක් වූ නොවැම්බර් මස 13 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසයේ) කොළඹ මහ නගර සභා සීමාව තුළ කොට්ඨාස අංක 9 හි කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කොච්චිකඩේ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොච්චිකඩේ උතුර හි පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. ජී. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් සාදන ලද 2013.09.10 දිනැති අංක 1946 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 දරන කැබැල්ල නමැති මුහුදු මාවතේ වරිපනම් අංක 319 දරන දේපළ සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේත් ය.

විශාලත්වය : අ. 0 රූ. 0 පර්. 3.42

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්නේ විසින් සහතික කරන ලද වර්ෂ 2014 ක් වූ ජනවාරි මස 31 දිනැති අංක 489 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදුකිරීම මොහොට්ටිගේ දොන් කිත්සිරි රාජපක්ෂ සහ වින්සන්ට් ශ්‍රීධරන් පීරිස් විසින් බන්ධනදායින් ලෙස ද වින්සන්ට් ශ්‍රීධරන් පීරිස් විසින් උකස්කරු ලෙස ද පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2014.10.10 වැනි දින ඩේයිලි නිව්ස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ ගැස්පහ හන්දියේ සිට මුහුදු මාවත ඔස්සේ මීටර 400ක් පමණ ගිය විට මෙම දේපළට ලඟාවිය හැකි අතර පාරේ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් වියදම් මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(1) ගැණුම් මුදලෙන් 10% ක් ද (සියයට දහයක්),
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද, (සියයට දෙකහමාරක්),
(4) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(5) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000).

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී එල් සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක : 011- 4667218/011-2565573.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011- 3068185, 2572940.

10-894

---

## මහජන බැංකුව - යක්කල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ නගර සභා බල සීමාව තුළ හෙනරත්ගොඩ ග්‍රාමයේ දෙල්ගහවත්ත නමැති පදිංචියට සුදුසු පරිසරයක පිහිටි නිවසක් සහිත පර්චස් තිස් හයක් (අක්. 0 රූඩ් 0, පර්. 36) විශාල බිම් කොටස මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014.11.11 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2013.02.15 දින ද, ඩේලි නිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 2013.02.08 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානයට යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ- නුවර පාරේ මිරිස්වත්ත හන්දිය පසුකර යක්කල දෙසට මද දුරක් යන විට දකුණට ඇති සුකිරිවත්ත පාර හමුවේ. එම පාරේ මීටර් 50ක් පමණ ගිය විට අංක 261/65 දරන මෙම දේපළ පාරේ දකුණු පස සුකිරිවත්ත පාරට මුහුණලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, යක්කල ශාඛාවේ කළමනාකාර වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033 - 2222325, 033- 2225008.
ෆැක්ස් අංක : 033 - 2226165, 033- 2226741.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176,
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

10-877

---

## මහජන බැංකුව - යක්කල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන හල්පේ ග්‍රාමයේ ඇම්බරැල්ලාගහවත්ත නමැති පදිංචියට සුදුසු පරිසරයක පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් විසි පහක (අක්. 1, රූඩ් 2, පර්. 25) නිවසක් සහිත ඉඩම මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2014.11.13 වැනි දින පෙ. ව. 11.00 ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 1999.09.03 වැනි දින ද, ඩේලි නිව්ස්, දිනමිණ, සහ තිනකරන් පුවත්පත්වල 1999.08.09 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානයට යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - මීගමුව සිට කටාන පාරේ කිලෝ මීටර් 10ක් ගිය විට වම්පසින් හමුවන හල්පේ පාවුලු විද්‍යාලයට මෙපිටින් පිහිටි දෙවන නිවස හා ඉඩම සුරැකුම් දේපළ වේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, යක්කල ශාඛාවේ කළමනාකාර වෙත ගෙවිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ප්‍රාදේශීය කළමනාකාර,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

දුරකථන අංක : 033 - 2222325, 033- 2225008
ෆැක්ස් අංක : 033 - 2226165, 033- 2226741.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 122ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593,
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176,
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

10-876

---

## හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී - නාවල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමා තුළ කඩුවෙල ඒකකයේ තලාහේන බෝගහවත්ත පාරේ වරිපනම් අංක 93/6 වශයෙන් දැක්වෙන "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ජී. වීරසිංහ මහතා විසින් 1995 සැප්තැම්බර් මස 12 වැනි දින දී මැන සාදන ලද පිඹුරේ ලොට් අංක 14 වශයෙන් දැක්වෙන ඉඩමේ ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම නවයයි නවයක් (අ. 0, රූ. 0, පර්. 10.99) ක් වපසරිය ඇති ඉඩම.

මෙම දේපළ වාසුල ජනක අරඹේවත්ත ආරච්චි යන අය ණයකරු හැටියට හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියන ලද්දාවූ ද 2011.03.28 වැනි දින අංක 4614 සහ

2011.10.05 වැනි දින අංක 4847 දරන බැදුම්කරයන් යටතේ බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - තලාහේන කනත්ත හන්දියේ සිට (බත්තරමුල්ල හරහා කොළඹ-කඩුවෙල පාර) මෙම දේපළට ලඟා වීමට නම් විජය පාරේ (තලාහේන පාර ලෙසත් නම් කොට ඇත) මීටර් 150ක් පමණ ගොස් හතරමං හන්දියට පැමිණෙන්න. ජම්බුගහ වත්ත පාර දෙසට දකුණට හැරී මීටර් 70ක් පමණ ගොස් වමට බෝගහවත්ත පාර දෙසට හැරී මීටර් 350ක් පමණ යන්න. වමට තුන්වන පටුමගට හැරෙන්න. මීටර් කිහිපයක් ගොස් හැරවුම් චක්‍රයට පිවිසෙන්න. ඔබේ වම් අත පැත්තේ අදාළ දේපළ දැකීමට පුලුවන.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් මා වෙතට පවරන ලද බලය යටතේ වර්ෂ 2014ක් වූ දෙසැම්බර් මස 03 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුතිය සඳහා.-* රජයේ ගැසට් පත්‍රයේ වර්ෂ 2013.06.14 වැනි දින ද, ඩේලි මිරර්, ලක්බිම සහ තිනකරන් පුවත්පත්වල වර්ෂ 2013.06.14 වැනි දින පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවීම් කළ යුතු ය.

01. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකක්) ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
04. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000ක් ද, සියලුම ප්‍රචාරක වියදම් ද,
05. නොතාරිස් ගාස්තු හා විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000ක් ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ (සියයට අනූවක්) මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවා නිම කළ යුතු වේ. එකී සියයට 90%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවොත් දැනටමත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු, (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 179, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 - 2661821, 011-2661835.

ඊ. එස්. රාමනායක,<br>
උසාවි කොමසාරිස්,<br>
බලයලත් වෙන්දේසිකරු තක්සේරුකරු,<br>
සහ සාම විනිසුරු.<br>
(මුළු දිවයිනට)

*කාර්යාලය :* අංක 25 බී, බෙල්මන්ට් වීදිය,<br>
කොළඹ 12<br>
දුරකථන අංක : 011-5756356, 011-2334808 (ෆැක්ස්)<br>
072-3836742.

10-875

---

**යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්ති ප්‍රකාරව විකිණීම පිළිබඳ දැන්වීමයි

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ උඩ පළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩ පළාත කඩුකාර පහළ කෝරළේ අටුවත්ත ග්‍රාම සේවා වසමේ නාරම්විට පිහිටි "පේරගොල්ලහේන" නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු බී. එම්. ගුණවර්ධන විසින් 2009.05.27 වැනි දින නැවත බෙදන ලද අංක 4419 දරන මානක පිඹුර ප්‍රකාර කැබලි අංක 2 දරන බිම් කොටසේ අනු බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් මැන සාදන ලද අංක 4419 සහ 2000.12.31 වැනි දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 2 ඒ දරන බිම් කොටස.

ප්‍රමාණය : අක්කර 0, රූඩ් 0, පර්. 11<br>
පර්චස් එකොළහක් විශාල ඉඩම් කොටස සහ ඒ මත පිහිටි ගොඩනැගිලි , ගහකොළ පළතුරු ආදී සියලු දේත් සමගය.

මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 285/197 යටතේ ලියාපදිංචි කර ඇත.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ. කැප්පෙටිපොළ විසින් සහතික කරන ලද අංක 26912 සහ 2013.08.02 වැනි දින දරන මූලික උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මොහොමඩ් ඉර්ෂාඩ් මොහොමඩ් මුෆීර් නොහොත් මොහොමඩ් ඉර්සාඩ් මොහොමඩ් මුෆීර් යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් කොළඹ 03, ගාළු පාරේ අංක 64 හි යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී මොහොමඩ් ඉර්ෂාඩ් මොහොමඩ් මුෆීර් නොහොත් මොහොමඩ් ඉර්සාඩ් මොහොමඩ් මුෆීර් විසින් පැහැර ඇති හෙයින්, යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව 2014 ක් වූ නොවැම්බර් මස 12 වැනි දින පෙ. ව. 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - ගම්පොළ නගරයේ සිට මීටර 200ක් පමණ නුවරඑළිය පාරේ ගමන් කොට වමට ඇති දොළුව පාරට හැරෙන්න. එතැන් සිට කි. මී. 1.5ක් පමණ ගමන් කළ විට 12/7 බෝක්කුව පසු කළ විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.* - විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය :-

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පී එල් සී ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05. ප්‍රචාරණ වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06. ලිපිකරු සොෂ්ක වේතන රු. 1,000,
07. නොතාරිස් ගාස්තු සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව, යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී, අංක 64, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2374100

ත්‍රිවංක සහ සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, 3 වැනි මහල,
හල්ස්ඩෝර්ෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංක : 0773 - 181891.

10-815

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳව දැන්වීම

ණය අංකය : ජීපී/02/01769/කේ2/491.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.11.14 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2014.01.27 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය 2013.08.29 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම මගින් සංශෝධනය කර සම්මත කළ පරිදි කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9 හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවිය විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2014.11.26 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළයේ දාසිය පත්තුවේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ වැගොව්ව ගමේ පිහිටි මීගහකුඹුර හා දොඹගහ පිල්ලෑව (නමුත් වැරදි ලෙස මීගහකුඹුර දොඹගහපිල්ලෑව, දඹගහවත්ත ලෙස ලියාපදිංචි වී ඇති) නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. එන්. සෙනෙවිරත්න විසින් මැන සකසන ලද 2000.12.01 දින හා අංක 4754 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 16.28 ක් වූ බෙදාවෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක සී 853/90 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩ බලන සාමාන්‍යාධිකාරිනි.*

2014 ඔක්තෝබර් මස 02 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

10-885

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.